# ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශන කටයුතුවල ඵලදායිතාවය කෙරෙහි අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන්ගේ බලපෑම

එදුරුසූරිය මොහොට්ටිලාගේ ගාමිණී ජගත් සේරම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය - 2018

# පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය එම්.ඩබ්ලිව්. ජයසුන්දර මහතාගේ උපදේශකත්වය යටතේ එදුරුසූරිය මොහොට්ටිලාගේ ගාමිණී ජගත් සේරම් වන මා විසින් ස්වාධීනව සකස්කරන ලද්දක් බවත් අදාල දත්ත මා විසින්ම සොයාගන්නා ලද බවත් මේ සඳහා යම් ලිඛිත තොරතුරක් යොදා ගනු ලැබූ සෑම අවස්ථාවකම ඊට අදාල මූලාශ්‍රය සපයා ඇති බවත් මෙම නිබන්ධය වෙනත් කිසිම අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක ඉදිරිපත් නොකරන ලද්දක් බවත් ප්‍රකාශ කර සිටිමි.

ලියාපදිංචි අංකය : 1705 SS2014001 ..……..…………………...

පර්යේෂකයාගේ අත්සන

# අනුමැති පත්‍රය

අපරාධ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අංක 1705 SS2014001 දරන අපේක්ෂකයා විසින් මාගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව මෙයින් සහතික කරමි.

උපදේශක වරයාගේ නම : මහාචාර්ය එම්.ඩබ්ලිව්. ජයසුන්දර

උපදේශක වරයාගේ අත්සන : ……………………

දිනය : ……………………

# පිදුම

සමාජය තුල ප්‍රයෝජනවත්

රාජ්‍ය නිලධාරියෙකු බවට පත්වීමට

ශක්තියක් වූ මාගේම දයාබර

දෙමව්පියන්ට සහ

ගුරු මැණිවරුන්ට සහ

පියවරුන්ටත්,

මාගේ සෑම සාර්ථක පියවරකදීම

මා හට ශක්තියක් වූ

ආදරණීය බිරිඳ සහ සිඟිති

දියණියන් දෙදෙනාටත්

පුදමි සෙනෙහසින්.......

# පටුන

**පිටු අංකය**


පටුන i - vi

කෙටි යෙදුම් vi

ස්තුතිය vii

සංක්ෂිප්තය viii - ix

**පළමු පරිච්ඡේදය**

**හැඳින්වීම**

1.1 අධ්‍යයන පසුබිම 1-7

1.2 පර්යේෂණ ගැටළුව 8-9

1.3 අධ්‍යයනයේ අරමුණු 9

**දෙවන පරිච්ඡේදය**

**සාහිත්‍යය විමර්ශනය**

2.1 සංකල්පීය විග්‍රහය 10-34

2.1.1 අපරාධය 12-21

2.1.2 අපරාධ විමර්ශනය 21-24

2.1.3 අපරාධ ස්ථානය 24

2.1.4 අපරාධ විමර්ශකයා (CI) 24-25

2.1.5 අපරාධ ස්ථාන විමර්ශනය 25

2.1.6 අපරාධ ස්ථාන විමර්ශකයා (CSI) 25-26

2.1.7 ශ්‍රී ලංකාව තුළ අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරි ව්‍යාපෘතිය 26-30

2.1.8 සාක්ෂි 30-32

2.1.9 ඵලදායිතාවය 32-34

2.2 න්‍යායාත්මක විග්‍රහය 34-39

2.2.1 ලොකාඩ්ගේ නියමය 35-36

2.2.2 06වෘත න්‍යාය - SixCircle Theory 37-38

2.2.3 The Stair Tool න්‍යාය 38-39

2.3 පර්යේෂණ ආශ්‍රිත පූර්ව ආනුභූතික අධ්‍යයනයන් 39-56

2.3.1 ලෝකයේ විවිධ රාජ්‍යන්හි අපරාධ විමර්ශන පිළිබඳ අධ්‍යයනයන් 39-45

2.3.2 ශ්‍රී ලංකාව මුල් කර ගත් අපරාධ විමර්ශන පිළිබඳ පර්යේෂණ 45-52

2.3.3 සොකෝ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ සහ ග්‍රන්ථ 53

2.4 පර්යේෂණ රික්තය හඳුනා ගැනීම 53-56

## තෙවන පරිච්ඡේදය

## අධ්‍යයන ප්‍රදේශය හා ක්‍රමවේදය

3.1 අධ්‍යයන ක්ෂේත්‍රය හා පර්යේෂණයේ ස්වභාවය 57

3.2 පර්යේෂණ ක්ෂේත්‍රය හා නියදිය තෝරා ගැනීම 57-58

3.3 දත්ත රැස් කිරීම 58-59

3.4 මූලාශ්‍ර 59-60

3.4.1 ලිඛිත මූලාශ්‍ර 60

3.4.2 අලිඛිත මූලාශ්‍ර 60

3.5 පර්යේෂණයේ සීමාවන් 60-61

## සිව්වන පරිච්ඡේදය

## ප්‍රතිඵලය හා සාකච්ඡාව


| | | |
|---|---|---|
| 4.1 | තෝරාගත් පරීක්ෂණාගාර දහයට අදාළ දත්ත විශ්ලේෂණය | 62-70 |
| 4.2 | පරීක්ෂණාගාර දෙකක් මගින් පරීක්ෂා කරන ලද අපරාධ ස්ථාන දෙකකට අදාළ සිද්ධි අධ්‍යයනය | 71-76 |
| 4.3 | ප්‍රශ්නාවලිය සහ සම්මුඛ සාකච්ඡාව | 77-90 |
| 4.4 | 4.4 අට වෘත න්‍යාය (Eight Circle Theory) | 90-91 |


## පස්වන පරිච්ඡේදය

## නිගමන හා යෝජනා


| | | |
|---|---|---|
| 5.1 | නිගමන | 92-95 |
| 5.2 | යෝජනා | 95-101 |

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 102-106


| **වගු නාමාවලිය** | | **පිටු අංකය** |
|---|---|---|

| වගු අංක 1.1 | බල අපරාධ වාර්තා වීම සහ විසඳීම 2017 | 4 |
| වගු අංක 2.1 | ඵලදායිතා සූත්‍රය | 33 |
| වගු අංක 2.3 | කාර්යක්ෂමතාවයේ සහ සඵලතාවයේ එකතුව දක්වන සූත්‍රය | 33 |
| වගු අංක 4.1 | ඵලදායීව හා ගුණාත්මකව ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05ක දත්ත (2013 - 2017 | 62 |
| වගු අංක 4.2 | අවම ඵලදායිතාවයකින් ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05 ක දත්ත | 66 |
| වගු අංක 4.3 | 2017 වර්ෂයේ ගම්පහ කොට්ඨාසයට වාර්තාවූ අපරාධ | 73 |
| වගු අංක 4.4 | 2017 වර්ෂයේ ගම්පහ පොලිස් ස්ථානයට වාර්තාවූ අපරාධ | 74 |

වගු අංක 4.5 සො.කො. නිලධාරීන් හා පොලිස් නිලධාරීන් අතර සහසම්බන්දතාවය 79

වගු අංක 4.6 සො.කො. නිලධාරීන් හා අනෙකුත් ඊට සම්බන්ධිත ආයතන අතර ඇති සහසම්බන්දතාවය 80

වගු අංක 4.7 වසර 05ක් තුළ ගම්පහ අපරාධ පරීක්‍ෂණාගාරයේ කාර්යක්‍ෂමතාවය 82

වගු අංක 4.8 සො.කො. නිලධාරීන්ගේ තම විෂය පිලිබදව දැනුම දියුණු කරගැනිම සම්බන්ධව 84

වගුඅංක 4.9 සො.කො. නිලධාරීන් සදහා පවත්වා ඇති පාඨමාලා සම්බන්ධ විස්තර 86

වගු අංක 4.10 සො.කො. නිලධාරීන්ගේ රාජකාරි තුළින් සැකකරුවන් වරදකරුවන් කිරීමේ කාර්යසම්බන්ධව 88

**රූප සටහන් නාමාවලිය** **පිටු අංකය**

රූප සටහන් අංක 2.1 අපරාධ විමර්ශන ක්‍රියාවලියේ සංකල්පීය රාමුව 11

රූප සටහන් අංක 2.2 අපරාධ සහ වරද යන සංකල්පය සරලව පැහැදිලි කිරීම 19

රූප සටහන අංක 2.3 අපරාධ ස්ථාන විමර්ශනය සදහා න්‍යායාත්මක රාමුව 35

රූප සටහන අංක 2.4 ලොකාඩ්ගේ ද්‍රව්‍ය හුවමාරු වීමේ සිද්ධාන්තය 36

රූප සටහන අංක 2.5 RodGehl සහ Darryl Plecas යන අපරාධ විද්‍යාඥයින් දෙදෙනාගේ අපරාධ ස්ථාන පරීක්ෂාව සම්බන්ධ හය වෘත න්‍යාය 37

රූප සටහන අංක 2.6 අපරාධ ස්ථාන පරීක්ෂාව පිළිබඳ තරප්පු පේළි න්‍යාය 38

රූප සටහන අංක 2.7 අපරාධ විමර්ශනයට අදාළව දැනුම කලමනාකරණය කිරීම සඳහා සකස්කරන ලද පර්යේෂන ප්‍රකාශන සිතියම 44

රූප සටහන අංක 4.1 අට වෘත න්‍යාය (Eight Circle Theory) 90

රූප සටහන් අංක 5.1 දැනට අපරාධ ස්ථාන පරීක්‍ෂණාගාරයන්හි භාවිත කරන සො.කො. රථය 98

රූප සටහන් අංක 5.2 ජාත්‍යන්තරව අපරාධ ස්ථාන පරීක්ෂාව සඳහා සකස් කර ඇති ව්‍යෝහාරික රථ 99

## ප්‍රස්තාර නාමාවලිය — පිටු අංකය


| | | |
|---|---|---|
| ප්‍රස්තාර අංක 1.1 | ශ්‍රී ලංකාව සහ මහා බ්‍රිතාන්‍යය අතර සැකකරුවන් වරදකරුවන් වීමේප්‍රතිශතය පිළිබඳ සංසන්දනාත්මක වාර්තාව- 2016 | 06 |
| ප්‍රස්තාර අංක 1.2 | ශ්‍රී ලංකාව සහ මහා බ්‍රිතාන්‍ය අතර කාන්තාවන්ට එරෙහි අපරාධ සම්බන්ධව වරදකරුවන් වීමේ ප්‍රතිශතය පිළිබඳ සංසන්දනාත්මක වාර්තාව- 2016 | 07 |
| ප්‍රස්තාර අංක 4.1 | ඵලදායීව හා ගුණාත්මකව ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05ක දත්ත (2013 - 2017) | 63 |
| ප්‍රස්තාර අංක 4.2 | ඵලදායීව හා ගුණාත්මකව ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05ක දත්තයන්හි සමස්ථ එකතුව | 63 |
| ප්‍රස්තාර අංක 4.3 | අවම ඵලදායිතාවයකින් ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05 ක දත්ත | 67 |
| ප්‍රස්තාර අංක 4.4 | අවම ඵලදායිතාවයකින් ක්‍රියාත්මක වන අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 05 ක දත්තයන් හි සමස්ථ එකතුව | 67 |
| ප්‍රස්තාර අංක 4.5 | පරීක්ෂණාගාර දහයෙහි සංසන්දනාත්මක වාර්තාව (2013-2017) | 69 |
| ප්‍රස්තාර අංක 4.6 | සො.කො. නිලධාරීන් හා පොලිස් නිලධාරීන් අතර සහසම්බන්දතාවය | 80 |
| ප්‍රස්තාර අංක 4.7 | සො.කො. නිලධාරීන් හා අනෙකුත් ඊට සම්බන්ධිත ආයතන අතර ඇති සහසම්බන්දතාවය | 81 |
| ප්‍රස්තාර අංක 4.8 | සො.කො. නිලධාරීන්ගේ තම විෂය පිලිබඳව දැනුම දියුණු කරගැනිම සම්බන්ධව | 84 |
| ප්‍රස්තාර අංක 4.9 | සො.කො. නිලධාරීන්ගේ රාජකාරි තුළින් සැකකරුවන් වරදකරුවන් කිරීමේ කාර්ය සම්බන්ධව | 88 |

## රාමු නාමාවලිය පිටු අංකය


| | | |
|---|---|---|
| රාමුව 01 - | මීරිගම සිදු වූ මනුෂ්‍ය ඝාතනය | 71 |
| රාමුව 02 - | සපුගස්කන්ද සිදුවූ නිවසක් බිඳ දේපල සොරකම් කිරීම සම්බන්ධව | 72 |
| රාමුව 03 - | සො.කො. නිලධාරීන් නොමැතිව සිදුකරන ලද විමර්ශනයන්හි සාර්ථක සහ අසාර්ථකභාවය | 75-76 |
| රාමුව 04 - | සො.කො. නිලධාරීන්ගේ කුසලතාවය පිලිබඳ දක්වන ලද අදහස් ස්ථානාධිපතිගේ අදහස | 83 |


## කෙටි යෙදුම් - (**Abbreviations)**

| | | |
|---|---|---|
| SOCO | - | අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරියා - Scene of Crime Officer |
| RFP | - | ඇඟිලි සටහන් රේජිස්ත්‍රාර් - Registrar of Finger Prints |
| CSI | - | අපරාධ ස්ථාන විමර්ශනය - Crime Scene Investigation |
| CI | - | අපරාධ විමර්ශනය - Crime Investigation |
| ද.නි.ස | - | ලංකා දණ්ඩ නීති සංග්‍රහය |
| අ.න.වි.ස. | - | අපරාධ නඩු විධාන සංග්‍රහය |
| SPSS | - | Statistical Package for the Social Sciences |
| SLQF | - | SriLanka Qulifications Frame Work |

# ස්තූතිය.....

අපරාධ විද්‍යාව පිලිබඳ උපදිෂ්ඨ ශාස්ත්‍රපති උපාධිය සඳහා වන ස්වාධීන පර්යේෂණ නිබන්ධය සඳහා වූ මෙම නිබන්ධනය ඉදිරිපත් කිරීම සඳහා උපදේශක ලෙස කටයුතු කරමින් මා හට නිසි උපදෙස් ලබා දුන් මහාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර මහතාට ප්‍රථමයෙන්ම මාගේ භක්ති පූර්වක ස්තූතිය පුද කරමි.

මෙම පර්යේෂණයේ දූර්වල තැන් පෙන්වා දෙමින් සාර්ථක සාහිත්‍යය විමර්ශනයක් බවට පත් කරමින් මා නැවත ධෛර්යය මත් කර සාර්ථක නිමාවකට මා අවතීර්ණ කර වූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් අමරසිංහ ඇදුරුතුමන් සහ ආචාර්ය නෙරංජි විජේවර්ධන ඇදුරුතුමියටත් මාගේ හදපිරි භක්ති ප්‍රණාමය පිරි නමමි.

මෙම පර්යේෂණය සඳහා අවශ්‍යය දත්තයන් ලබා ගැනීමට මා හට සහය වූ ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ වාර්තා කොට්ඨාසයේ සමස්ථ කාර්ය මණ්ඩලයට සහ අපරාධ ස්ථාන පරීක්‍ෂණාගාරයන්හි රාජකාරි නියතු සියලූම කාර්ය මණ්ඩලයටත් මාගේ භක්ති ප්‍රණාමය පිරි නමමි.

තවද මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා මා හට සහය ලබා දුන් රජයේ රස පරීක්‍ෂක දෙපාර්තමේන්තුව, කොළඹ අධිකරණ වෛද්‍ය කාර්ය මණ්ඩලය, කොළඹ සහ ගම්පහ මහාධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණයන් හි කාර්ය මණ්ඩල, නීතිපති දෙපාර්තමේන්තුව කාර්ය මණ්ඩලය සහ ජීන්ටෙක් ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත මාගේ විශේෂ ස්තූතිය පුද කරමි.

මෙම නිබන්ධනය සාර්ථකව නිමා කරගැනීම සඳහා නන් අයුරින් සහය ලබාදුන් දූමින්ද, රත්නසිරි, ලාල්, ධනුෂ්ක, රශිතා, අයිරින්, සමරකෝන්, ශ්‍රීනාත් වෙත මාගේ හද පිරි ස්තූතිය පිරි නමන අතර මෙම සුවිශේෂි කටයුත්තේ දී, දිවා රෑ වෙහෙස වෙමින් තම පෞද්ගිලික කටයුතු ද මඟ හරවමින් මා හට ශක්තියක් ලබා දුන් මදුමන්ත වෙත මාගේ ස්තූතිය පුද කරනු ලබන්නේ ඉමහත් සතුටකිනි.

අවසාන වශයෙන් මෙම නිබන්ධනය සාර්ථක කර ගැනීම සඳහා සුවිශේෂි අදහස් සහ මග පෙන්වීම් ලබාදෙමින් මා දිරිමත් කර චන්දිමා නැගෙනියටත්, මා හට මෙම පර්යේෂණයේ පූර්ණ කාලීනව නියැලීමට අවශ්‍ය සියළු ඉඩ ප්‍රස්ථාව සලසා දෙමින් පවුලේ සියළු වගකීම් දරමින් මා හට ශක්තියක් වූ දයාබරහේමාලිටත්, මාගේ දියණියන් වන ජනන්‍යා සහ හසන්‍යා යන දෙදෙනාටත් මාගේ හදපිරි ස්තූතිය කරන්නේ ඉමහත් සතුටෙනි.

# ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශන කටයුතුවල ඵලදායිතාවය කෙරෙහි අපරාධ ස්ථාන පරීක්ෂා කිරිමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන්ගේ බලපෑම

එදුරුසූරිය මොහොට්ටිලාගේ ගාමිණි ජගත් සේරම්


## සංක්ෂිප්තය

අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන්ගේ කාර්යභාරය ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශනයට බලපා ඇත්ද? යන්න මෙම අධ්‍යනයේදි විමසා බලන ලදි. සැකකරුවන් වරදකරුවන් වීමේ ප්‍රතිශතය ශ්‍රී ලංකාව තුල අවම අගයක් ගැනීම සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. එම හේතුවෙන් ශ්‍රී ලාංකීය ජන සමාජය අපරාධ වලට බියෙන් ජීවත්වීමේ අභාගයට මූණ දී ඇත. මෙහිදී සාමාන්‍ය සිවිල් ජනයා අපරාධ බියකින් ජීවත්වීම රටේ ආර්ථිකයට, අභිවෘද්ධියට හා සංවර්ධනයට ප්‍රබලව බලපාන අදෘෂ්‍යමාන බලවේගයක් බවට පත්වී ඇත. මෙම අභාග්‍ය සම්බන්ධ තත්වය මෙරට තුළ ඇතිවීම සඳහා ආර්ථික, සමාජීය හා දේශපාලන හේතු ද බලපා ඇත.

යම් අපරාධයකට අදාලව අත් අඩංගුවට ගන්නා සැකකරුවෙකු නියමිත නඩු විභාගයකින් පසු වැරදිකරු හෝ නිවැරදිකරු බවට මෙරට මහේස්ත්‍රාත් අධිකරණයකින් හෝ මහාධිකරණයකින් තීන්දු කරනු ඇත. මෙවැනි නඩු විභාගවල දි බොහෝවිට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බැවින් සැකකරුට එරෙහි චෝදනාව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමට පැමිණිලි පාර්ශවයට (බොහෝ වේලාවට පොලීසියට) නොහැකිවීම යන හේතුව මත සැකකරුවන් නීතියේ දඩුවමින් නිදොස්කොට නිදහස් වීමක් දක්නට ඇත. මෙම තත්වය රටක සැකකරුවන් වරදකරුවන් වීමේ ප්‍රතිශතය ඉහළ මට්ටමක නොතිබීමට ප්‍රබල හේතුවක් වී ඇත. එසේනම්, මෙහිදී එවැනි සැකකරුවන් තමාට ඇති චෝදනාවලින් නිදහස් වීමට ප්‍රබල හේතු සාධකයක් වී ඇත්තේ, චූදිත තැනැත්තාට එරෙහි සාක්ෂි ඇසදුටු සාක්ෂි වීමෙනි. මෙම ඇසදුටු සාක්ෂි විවිධ හේතූන් මත වෙනස් වන අතර උදාහරණ ලෙස, සාක්ෂිකරු මියයාම, රෝගාතුරවීම, බොරු සාක්ෂි දීම, බිය ගැන්වීම, අල්ලසට ගොදුරුවීම හා අමතක වීම යන හේතු පෙන්වා දිය හැකිය.

එනම්, ඉහත කාරණාවට පිළියමක් ලෙස ඇසදුටු සාක්ෂි වෙනුවට විද්‍යාත්මක සාක්ෂි චූදිතයන්ට එරෙහිව නඩු කටයුතුවලදී යොදාගැනීම සම්බන්ධයෙන් මෙරටදී කතිකාවක් ගොඩනැගී ඇති අතර 2006 වර්ෂයේදි, ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශනය සඳහා නව විද්‍යාත්මක ක්‍රමවේදයක් වන සො.කො. (SOCO) ව්‍යාපෘතිය හදුන්වා දී ඇත. එයින් උත්සාහ කර ඇත්තේ චූදිත තැනැත්තාට එරෙහිව පර්වේෂණ සාක්ෂි එනම්, විද්‍යාත්මක හා භෞතික සාක්ෂි යොදාගැනීම තුලින් ඇසදුටු සාක්ෂිවල දුර්වලතාවයන් මගහරවා ගෙන එමගින්, සැබෑ අපරාධකරුවන්ව අධිකරණය ඉදිරියේ දී වරදකරුවන් කිරීමේ හැකියාව ඇති බවයි.

එසේනම්, අද වන විට මෙම විද්‍යාත්මක ක්‍රමවේදය මෙරට අපරාධ විමර්ශනය සඳහා හඳුන්වා දී වසර 10ක් ඉක්මවා ගොස් තිබීම නිසා එම කාර්යයේ නියැලී සිටින සො.කො. නිලධාරීන්ගේ කාර්යභාරය හේතුකොට ගෙන මෙරට අධිකරණයන් මගින් විභාග බරනු ලබන නඩු කටයුතු තුළින් වරදකරුවන් වීමේ ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් තිබේද? යන්න පරීක්ෂා කිරීමටමෙම පර්යේෂණය තුලින් උත්සාහ කරන ලදි.

එම පර්යේෂණය සාර්ථක කරගැනීම සඳහා අදාළ කරුණු හා දත්ත ලබාගැනීම පොලිස් මූලස්ථානය, අපරාධ වාර්තා කොට්ඨාසය, තෝරාගන්නා ලද අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 10කින් සිදුකර ඇත. තවද සො.කො. නිලධාරීන් 100 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලියක් මගින් අවශ්‍ය කරුණු ලබා ගැනීමත්, මෙම විෂයට අදාල තැනැත්තන් 24 දෙනෙකු සම්මුඛ සාකච්ඡාවකට ලක් කරලබා ගන්නා ලද දත්ත එස්.පී.එස්.එස්. මෘදුකාංගය භාවිත කර විශ්ලේශනය සිදු කරන ලදි. ඒ අනුව සාර්ථක පර්යේෂණයක යෙදිමින් නිබන්ධනයේ ගැටළුව හඳුනාගනිමින් එහි අරමුණ සාක්ෂාත් කරගැනීමට හැකි වූ අතර ඒ තුලින් සාර්ථක යොජනා හා නිගමනයන් ඉදිරිපත් කිරීම සිදුකල අතර නිගමනයන් ලෙස මෙම සො.කො. ව්‍යාපෘතියට වසර 11ක් ගතවී තිබුණත් එම ව්‍යාපෘතියේ ඵලදායිතාවය පිළිබඳ මෙතෙක් පර්යේෂණයක් සිදුකල නොමැති බවත් සො.කො. නිලධාරීන් සහ පොලිස් ස්ථානයන් අතර දුරස්ථ සබඳතාවය, නිසා සො.කො. නිලධාරීන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීමට බාධාවක් වී ඇති බවත්, සො.කො. නිලධාරීන් නොමැතිව සිදුකරන ලද අපරාධ විමර්ශනයන් බොහෝ අවස්ථා වල දී අසාර්ථක වී ඇති බවත්, ස්වාධීනත්වය ආරක්ෂා වන පරිදි සො.කො. ව්‍යාපෘතියේ සැලසුම් කඩිනමින් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති බවත්, ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරී ව්‍යාපෘතිය තව දුරටත් ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය බවත් නිගමනයන් ලෙස නිගමනය කරමින් මෙම පර්යේෂණ නිබන්ධනය සාර්ථකව අවසන් කිරීමට හැකියාව ලැබුණි.